**රබර් නැවත වගා සහනාධාර අරමුදල - 2017**

-----------------------------------------------------

රබර් නැවත වගා සහනාධාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ඇවර ගිණුම හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනට ඇවර ගිණුම 1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර පනතේ (437 අධිකාරිය) 6 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අරමුදල ඇවර කිරීම

-----------------------

2009 ජූලි 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ දී රබර් නැවත වගා සහනාධාර අරමුදල ඇවරකරන ලෙස නියෝග කර තිබුණි.ඒ අනුව අවස්ථා දෙකකදී ඇවරකිරීමට කමිටු දෙකක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර ඇතත් ඇවරකිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. ඉන්පසු 2016 මාර්තු 17 දිනැති අමප/16/0373/726/006 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අරමුදල ඇවර කිරීමට අනුමැතිය ලැබී දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක මාස 03 ක කාලයක් සඳහා ඇවරකරුවකු ලෙස පත්කර තිබුණ ද ඇවර කටයුතු සිදු කර නොතිබුණි.

## 1.5 වත්මන් ඇවරකරු පත් කිරීම

2017 ඔක්තෝබර් 04 දිනැති අංක අමප/17/1879/726/044 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මාස 4 කින් රබර් නැවත වගා සහනාධාර අරමුදලේ හා රබර් පාලන අරමුදලේ ඇවර ගිණුම් පිළියෙල කිරීම වෙනුවෙන් රු.625,000 ක මුදලක් ඒකාබද්ධ අරමුදලින් දැරීමට හා ඇවර කිරීමේ කටයුතු නිම කිරීමට ඇවරකරුවකු පත් කිරීම සඳහා අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2017 ඔක්තෝබර් 16 දින ඇවරකරුවකු පත් කර තිබුණි. ඇවරකරු විසින් ඇවර කටයුතු පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම්වරයාට 2018 මාර්තු 05 වන දින ඉදිරිපත් කර තිබුණි.

## 1.6 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2017 දෙසැම්බර් 31 දිනට රබර් නැවත වගා සහනාධාර අරමුදලේ ඇවර ගිණුම සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අරමුදලේ වත්කම් සහ බැරකම් සත්‍යාපනය සඳහා අවශ්‍ය ඇතැම් පොත්පත්, ලේඛන හා වාර්තා වලින් කොටසක් නොමැති බව ලිඛිතව දන්වා තිබුණු අතර ඉකුත් විගණන වාර්තා වලින්ද එය තහවුරු වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 අරමුදලේ වත්කම් හා බැරකම්

අරමුදල අවසන්වරට විගණනයට ඉදිරිපත් කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ වත්කම් හා ජංගම බැරකම් ශේෂ පහත දැක්වේ.

| **විෂයයන්** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂයන්** | |
|---|---|---|
| | හර<br>රු. | බැර<br>රු. |
| ජංගම වත්කම් | 6,462,290 | |
| වෙනත් ජංගම වත්කම් | 178,438,206 | |
| ජංගම බැරකම් | | 20,090,250 |
| සමුච්චිත අරමුදල | | 164,810,246 |
| එකතුව | 184,900,496 | 184,900,496 |

**3.2** **මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

2016 දෙසැම්බර් 31 දිනට අරමුදල සතුව පැවති වත්කම් හා බැරකම් ශේෂවලට ඇවරකරු විසින් ගැලපුම් කර ශුද්ධ වටිනාකම් ඇවර ගිණුමට මාරු කිරීමෙන් පසු එම ගිණුමේ වූ රු. 1,343,917 ක හර ශේෂය රබර් නැවත වගා සහනාධාර අරමුදලට මාරු කර තිබුණි. රබර් නැවත වගා සහනාධාර අරමුදලේ වූ රු. 130,497,592 ක බැර ශේෂය ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමෙන් පසු රබර් නැවත වගා සහනාධාර අරමුදල පියවා තිබුණි.